# මහේල සීයක් ගහනකොට ටෙන්ඩුල්කාර් නිකම්ම කැඩිල ගියා

ක්‍රිකට් ක්‍රීඩාව මහ විහිළුවක් බවට පත් කළ අවස්ථාවක් ඉතිහාසයේම නැතිව ඇති. ගරු කටයුතු ක්‍රීඩාවක් හැටියට ක්‍රිකට් ප්‍රසිද්ධ වෙලා තිබුණේ. සාමාන්‍යයෙන් ජරා වැඩක් කළොත් කථාවට කියන්නේ ඕක නම් ක්‍රිකට් නෙවෙයි කියලයි. මහත්මා ගුණය ක්‍රිකට් වලට පංගාර්තු කරලයි තිබුණේ. දැන් බැලුවහම ඒක හැර හැම දෙයක්ම ඒකට අඩංගුයි.

ආණ්ඩුව බැලුවේ ක්‍රීඩකයින්ට උදව් කරන්න නම් නෙවෙයි. තමන්ගේ අවලම් පාලනයට තව වලංගුකමක් ක්‍රිකට් හරහා ලබාගන්න. ඒ අනුව ජයග්‍රහනය අනිවාර්ය බවට පත් කළා.

ඒත් සදාතනිකවම කියන්නේ ක්‍රිකට්වලට ඒ විදියට ස්ථිර තීන්දුවක් දෙන්න බෑ කියලයි. බ්‍රැඩ්මන් වගේ මහා පිතිකරුවන් බින්දුවට කැඩිල ගිහිල්ල තියෙනවා නාඳුනන බෝල දමන්නන්ට.

එහෙම තියෙද්දී මහින්ද බැලුවේ හැම බලයක්ම යොදල අනිවාර්ය ජයක් ක්‍රීඩකයන්ගේ කරේ එල්ලන්නටයි. ඒ අනුව තමා සංගක්කාර නූතන නීල මහ යෝධයෙක් බවට පත් වුණේ. මහින්ද ලොකුවට ගජබාහුට ඇඳල භාරතයට අඩිය තැබුවේ වැලි මිරිකලා වතුර පෙන්වන්නටයි. කාටවත් උස්සන්න බැරි යගදාවක් කුමාට බාර කළා.

අන්තිමට සෙල්ලම සෙල්ලමම වුණා. කාටවත් ඒක ඕන විදියට හරවන්න බැරි වුණා. ලංකාව පැරදුනා වගේම ටෙන්ඩුල්කාර් නිකම්ම කැඩිල ගියා. ඒ දෙකම පෙන්වන්නේ අනියත වූ විශ්මිත වූ ක්‍රිකට් සෙල්ලමයි. පුදුමය නම් මහේලම සියයක් ගහපු එකයි.

මාස ගණනාවකට පෙර මහින්ද ප්‍රකාශ කළේ මහේල විදේශ මුදල් අරගෙන බින්දුවට සෙල්ලම් කරනව කියලයි. ඒ විදියට කැත විදියට තමන්ගේම රටේ ක්‍රීඩකයින්ට පොළොව පැලෙන බොරු චෝදනා කරපු මිනිස්සුම මහේලගේ සීය උඩ රැඳිල තමන්ගේ නිරුවත වසා ගන්නට හදන එක නම් විශ්මය ජනකයි. ආශ්චර්යයක්මයි.

නූතන ගජබාහු හැදුවේ ක්‍රිකට්වලින් වැලි මිරිකල, වතුර පෙන්වල, ලංකාවම තවත් හොල්මන් ගමනක් ගෙනියන්නටයි. මොකද, තමන් මහ එවුන්ට දොළපිදේනි පූජා කරමින්, පොඩි එකාට දෙන පාරවල් අමතක කරවගන්න මේ වැඩේ යොදා ගන්නටයි බැලුවේ. ඒ වෙනුවෙන් නටපු දහඅට සන්නිය නිසාම ක්‍රීඩකයින්ට සෙල්ලම් කරන්න බැරි වුණා.

කිසිම හිතේ නිරවුලක් නැතිව, ලොකු බරක් කර උඩ තියාගෙන, මොන නීල මහ යෝධයටද වැලි මිරිකල වතුර ගන්න පුළුවන්. මොන විජ්ජාව කරන්නත් නිදහස ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්න ඕනෑ.

ක්‍රීඩකයෝ කියන්නේ, විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩකයෝ කියන්නේ රේල් පීළි උඩ තියල තල්ලු කරල අරින්න පුළුවන් බෝනික්කෝ නෙවෙයි. මනස යොදවල, සැලසුම් කරල කරන්න ඕනෑ සෙල්ලමක් ඒක. ජාතිවාදී අදහස්වලින් හිත හොල්මන් කළයි කියල හොඳට ක්‍රීඩා කරන්න බෑ.

ඒ විදියට ඡන්ද ගන්න පුළුවන් වුණාට ලකුණු ගන්නවත්, බෝල දමන්නවත් පුවන්කමක් නෑ. ජාතිවාදයෙන් වෙන්නේ ක්‍රීඩකයින් අතර විශ්වාසය බිඳී වැටෙන එක විතරයි. මහේල සල්ලිවලට යට වුණ බව කියල ඇති කරපු මානසික වැටීමත් ලේසියෙන් ගොඩනගන්න බෑ. ඒ උඩ වැටිල තියෙන්නේ මහේලට වඩා අනෙක් අය.

දැන් මේ රතිඤ්ඤවලට කෝටි ගණන් වියදම් කරල දමන්න බලන් හිටපු සෙප්පඩවිජ්ජාව නැති වුන නිසා දැන් ආර්ථික පහර ගැන ජනතාවට දැනෙන්න පටන් අරන්. අනෙක් අතට ක්‍රිකට් හොල්මන්වලින් ආණ්ඩුව බලාපොරොත්තු වුණේ ආර්ථික බර පැටවීම පමණක් නෙවෙයි, දෙමළ නායකයින්ව බිය වද්දල බලය බෙදීම යට ගහන්නත්, අනෙක් අතට මානව අයිතීන් පිළිබඳ ප්‍රශ්න යට ගහන්නත් බලාපොරොත්තු වුණා.

දැන් මේ හැම එකක්ම උඩට එන එක වේගයෙන් වේවි. මේ ආණ්ඩුවට විරුද්ධව ලොකු බලවේගයක් ඇති කරන්නට නම් ජාතිවාදයෙන් තොරව විපක්ෂ බලයක් ගොඩනැගිය යුතුයි.

දෙමළ ජාතික පෙරමුණ මේ වෙලාවේ බලා ඉන්නේ ආණ්ඩුව දිහාවයි. ඉන්දියාවේ නායකයින් ඔවුන්ට බල කරන්නේත් ඒ විදියට ආණ්ඩුව සමහම කේවල් කරන ලෙසයි. ඒත් මහින්ද බලපෑම්වලට යට නොවී සිංහල ජාතිවාදී බලවේග මත යැපිල කට්ටි පනිනවා නම් ටී.එන්.ඒ. නායකයෝ මොනවද කරන්නේ.

දැන් ඒ තත්ත්වය මතු වෙමින් එනවා. ඉඩම්, පොලිස් බලතල සමහ බදු අයකිරීමේ අයිතිය ඉල්ලාගෙන ලියවිල්ලක් TNA නායකයෝ ඉදිරිපත් කරල තියෙනවා. ඒ ගැන සාකච්ඡාව පස්සට තියල එදිනෙදා කටයුතු ගැන කථා කරන්න පටන් අරන්.

ඒත් ඒකත් ඇණහිටල තියෙන්නේ දේශපාලන සිරකරුවන්ගේ ප්‍රශ්නය තුළින්. එවැනි ලැයිත්වක් නෑ කියලයි ආණ්ඩුව කියන්නේ. ඒත් කොටි සාමාජිකයන් පුනරුත්ථාපනය කරනව කියලත් ආණ්ඩුව කියනවා.

ඒ අනුව එවැනි පුනරුත්ථාපනය කළ අය කියල වරින්වර භාරදහසක් විතර එළියට දමල තියෙනවා. එතකොට තව කොච්චර ඉන්නවද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒ ගැන කිසිම තොරතුරක් ලබාගන්න බැරි වුණ බවයි TNA නායකයෝ කියන්නේ.

ඊළහට යුද්ධයෙන් නැති වුණ අය කොපමණද? ආණ්ඩුවේ ලියවිලි අනුවම ලක්ෂයකට වැඩිය දෙමළ ජනතාව මැරිල තියෙනවා. හමුදාවේ සිංහල අය 33,000 ක් නැතිවුණා කියල ප්‍රකාශ කරල තියෙනවා. දෙමළ මැරුණ ගණන ලක්ෂ එක හමාරක් විතර වෙනව කියල දෙමළ පූජකතුමෙක් ප්‍රකාශ කරල තියෙනවා. ඒත් ආණ්ඩුවේ කිසි ලේඛණයක් ඉදිරිපත් වෙලා නෑ.

මේ ප්‍රශ්නය ගැන TNA සංවිධානය දිගටම කථා කරන බවයි කියන්නේ. ආණ්ඩුව මේවාට පිළිතුරු නොදී ඉන්නේ සිංහල ජාතිවාදී බලවේගය මත යැපිලයි. ඒ උදෙසා තමයි මේ සිංහයෝ සටන්පාඨය උඩ ක්‍රකට් ක්‍රීඩාව මෙහෙයවන්න කටයුතු කළේ. දැන් ඒකත් ගැස්සිලා ගියා.

අලි මදිවට හරක් කිව්වා වගේ දැන් වතු කම්කරුවන්ගේ පඩිය ගැන ප්‍රශ්නය කරලියට ඇවිත්. සාමූහික ගිවිසුම අලුත් කිරීමේ කතාව දැන් පටන් අරන්. පහුගිය ගමන 500/=ඉල්ලුවත්, ඊට හුහක් අඩු තැනක තමා ඇත්ත මාසික පඩිය නැවතුනේ.

දැන් උද්ඝමනය ගැන කියල 700/=ක් ඉල්ලල තියෙනවා. ඒත් 500/=වත් දෙන්න තාමත් බෑ කියල තමා වතු පාලකයෝ කියන්නේ. ඒ විදියට ගෙවල වතු ගෙනියන එක පාඩුයි කියලයි කියන්නේ. ඒත් කුඩා වතුහිමියෝ තමන්ගේ කුඩා වතු ලාභ ඇතිව පවත්වාගෙන යනවා.

එහෙම නම් මේ මහා පරිමාණ වතු සියල්ලම ඒ තත්ත්වයට ගේන්න වෙනවා. වතු ධනපති ක්‍රමයටම නෙවෙයි ගෙනියන්නේ. එක්තරා වහල් බැමි වලින් තමා වතු නඩත්තු කරන්නට පාලකයෝ තවමත් වැඩ කරන්නේ.

මේ තත්ත්වය අනිවාර්යයෙන්ම වෙනස් කරන්න වෙනවා. තොණ්ඩමන්ලා මේකට ඉඩ දීල තියෙන නිසයි වතු කම්කරුවෝ යට වෙලා ඉන්නේ. තොණ්ඩගේ බැම්ම බිඳ වැටුනොත් වතු කම්කරු සටන ප්‍රබල සටනක් බවට පත්වෙනවා. හැටන්වල ඇති වුණ ගැටුම අලුත් මුහුණුවරක් ගත්තා. පොලීසිය එයට මැදිහත් වුණේ රජයට පක්ෂ බලවතුන්ගේ ඉල්ලීම උඩයි. එතැන තිබිල තියෙන්නේ දේශපාලන ගැටුමක් බවයි එයින් එළිවෙන්නේ.

වතුකරය තුළ ආණ්ඩුවේ ජාතිවාදී මර්දනයට මුහුණ දෙන්නට වතු කම්කරුවෝ එළියට එන බව අපට එයින් පැහැදිලි වෙනවා. දැන් තොණ්ඩමාන් මහ කලු සිංහලයා බවට පත්වෙලා කියල සමහරු කියනවා. මේ නූතන මහ කලු සිංහලයා ගැන පොලීසියත් එතරම් පැහැදීමක් නෑ වගේ. මොකද? ඒ අයත් කිව්වේ ඉහළින් එන ඕඩර් අනුව තමා අපටත් ක්‍රියා කරන්න වෙන්නේ කියලයි.

ඉහළින් ඕඩර් එන්නේ ඉතින් වෙන කාගෙන්ද, මහ කලු සිංහලයගෙන් මිසක්. පහුගිය කාලය තුළම ඉන්දියාව ඇතුළු ණය ආධාර දෙන රටවල් වතුකරය සඳහා සහනාධාර දුන්න. ඒවායින් ගෙවල් හදන්න, වතුර - විදුලිය දෙන්න, පරවල් හදන්න, වතු පාසල් දියුණු කරන්න ආදී වැය කටුයතු කෙරුණා.

මේවා තුළින් තමයි මහ කලු සිංහලයා යැපිල ඉන්නේ. මොකද, මේ වැඩපිළිවෙල දියත් වෙන්නේ ඒ ඇත්තන්ගේ අණසක යටතේ නිසා. ඒත් වතු කම්කරු වැටුප් ප්‍රශ්නය මේ සුහසාධන උඩම යට කරල තියන්න බෑ. ඒක මේ වෙලාවේ ලොකුවට නැගිල එයි කියලයි මට නම් පෙනෙන්නේ.